UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2010**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

*2293208676*

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.

At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

DC (LEO/TL) 25616/3
© UCLES 2010

UNIVERSITY of CAMBRIDGE International Examinations

**[Turn over**

www.XtremePapers.net

**BLANK PAGE**



WWW.XTREMEPAPERS.NET

## Section A – Translation

**1** Translate into **English**:

අද ලොව සෑම රටකම මෙන් ප්‍රධාන ප්‍රවාහන ක්‍රමය වී ඇත්තේ මොටෝරියයි. මොටෝරිය මුලින්ම භාවිතයට පැමිණියේ 19 වන සියවසේ අගභාගයේදීය. එකල මොටෝරිය එතරම් සුලබ නොවූ හෙයින් ඒවා පැදවීමේ දී සහායකයකු ද යොදාගන්නා ලදී. ඔහුගේ කාර්යය වූයේ මාර්ගයේ ගමන් කළවුන්ට රතුකොඩියක් වනමින් අනතුරු අඟවමින් ඉදිරියෙන් ගමන් කිරීමයි. 1885 දි නිපද වූ මුල්ම මොටෝරිය රෝද තුනකින් යුක්ත වූ අතර එහි උපරිම වේගය වූයේ පැයට සැතපුම් හතරකි. එහෙත් 1900 වන මොටෝරිය ඉතාමත් ජනප්‍රිය තත්වයට පත්ව තිබිණ. එකලස් පේළි [assembly line] භාවිත කරමින් කාර් විශාල වශයෙන් නිෂ්පාදනය කෙරුණු අතර එක් පුද්ගලයකුට කිරීමට සිදුවූයේ එක් කාර්යයක් පමණි. එකලස් කිරීමට ගතවූ කාලය අඩුවීම නිසා නිෂ්පාදන වියදම ද අඩුවිය. මේ අනුව ෆෝඩ් කාර් සමාගමට විනාඩි අනූහතරකින් එක් කාරයක් නිෂ්පාදනය කිරීමට හැකිවිය.
මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ෆෝඩ් ලෝකයේ විශාලතම වූත් අතිශයින් සාර්ථක වූත් සමාගමක් බවට පත්විය.

[10]

**2** Translate into **Sinhala**:

The paddy fields were muddy after the heavy rains and many of the tall plants were lying flat on the ground. A boy stepped lightly through the puddles, making sure as he placed his toes down that he could feel the solid ground beneath him. Earlier in the day, he had watched his friend skip through the field in a hurry, and fall waist deep into a small pool of water.

He wanted to go and see what state the railway track was in at the other side of the field. The train that goes between the big cities passes this point twice a week, just after midday. The service had been disrupted by heavy rains that had submerged part of the track.

As he went into the field that the track passed through, he noticed that the track was not even visible. He had to wade almost knee deep through the water. In the distance, he heard the sound of an engine. There was no doubt that the train was on its way. He watched anxiously.

As the sound grew louder, he saw the train appear in the distance. Ahead of him, he could still see no track. The engine rounded a corner and he watched as mud splashed up over two metres high onto the windows of the train. Seconds later, the front of the train sped past him and the carriages followed behind. Today, there were no problems.

[20]

© UCLES 2010

WWW.XTREMEPAPERS.NET

## Section B – Reading Comprehension

Read the following passage carefully and then answer the questions in **Sinhala**.

### කොලෝසියම

කොලෝසියම යනු ඉතාලියේ රෝම නගරයේ පිහිටි ඓතිහාසික ගොඩනැගිල්ලකි. එය පුරාණකාලයේ භාවිත වූයේ නරඹන්නන් 50,000 කට ආසන පහසුකම් තිබූ විශාල ප්‍රේක්ෂාගාරයක් ලෙසිනි. එහි මැද වූ රංගභූමිය මත ග්ලැඩියේටර නමින් හැඳින්වුණ රණශූරයින් දෙදෙනෙක් බිහිසුණු සටන්වල යෙදුණාහ. ඇතැම් අවස්ථාවල කිසියම් භයානක සතකු සමග සටන් කිරීමට ද ග්ලැඩියේටරයින්ට සිදුවිය. සම්පූර්ණයෙන්ම කවාකාර නොවන මේ ගොඩනැගිල්ල වසර 2000 ක් පැරණිය. ක්‍රි. ව. 70 දී පමණ රෝම අධිරාජයා වූ වෙස්පැසියන්ගේ නියමයෙන් මේ ගොඩනැගිල්ලේ වැඩ ඇරඹෙන්නට ඇතැයි ඉතිහාසඥයෝ විශ්වාස කරති. එහි වැඩ නිමවන්නට අවුරුදු දහයක් ගතවිය.

එක් රෝම ඉතිහාසඥයකුට අනුව මේ ප්‍රේක්ෂාගාරය විවෘත කිරීමේ උත්සවයේ දී පැවැත් වූ ක්‍රීඩාවල දී මරණයට පත් වූ සතුන් සංඛ්‍යාව 9000 කට වැඩිය. ආගමික පූජෝත්සව හා නාට්‍ය වැනි දේ පමණක් නොව ක්‍රීඩා වැනි ජනප්‍රිය විශෙෂාංග ද රාශියක් වසර 500 කට වැඩි කාලයක් තිස්සේ  කොලෝසියම තුළ පවත්වා ඇත.

මධ්‍යයේ වූ දැවමය රංග භූමිය යටින් කාමර සහ අතුරු මාර්ග රාශියකින් සැදුණ සංකීර්ණයක් විය. ඒවා භාවිත වූයේ සතුන් සහ කිසිදු නිදහස් අයිතිවාසිකමක් නොතිබූ වහලුන් රඳවා තැබීමටය. ක්‍රීඩා තරඟ පටන් ගැනීමට පෙර ඔව්හු ග්ලැඩියේටරයින් ලෙස සටන් කළහ. කුලුණු සහ ආරුක්කු වටේත් ගොඩනැගිල්ල ඇතුළත කවාකාරවත් නරඹන්නන් සඳහා ආසන පේළි තට්ටු වශයෙන් සකසා තිබිණි. දොරටු අසූවකට ආසන්න සංඛ්‍යාවකින් ප්‍රේක්ෂකයින්ට පහසුවෙන් හා ආරක්ෂා සහිතවත් ඇතුළුවීමට හා පිටවීමට හැකිවිය.

රෝම අධිරාජ්‍යය බිඳවැටීමෙන් පසුව කොලෝසියම අතහැර දමා තිබිණ. එහෙත් ඉක්මණින්ම නගරය අවට විසූ රටේ පාලන බලය හිමි රදළපවුල් විසින් එය බලකොටුවක් ලෙස යළි භාවිතයට ගන්නා ලදී. ඒ අතරම ගොඩනැගිලි ද්‍රව්‍ය සොරා ගැනීම සඳහා එයට හානි කිරීම ද මධ්‍යතන යුගයේදී ක්‍රිස්තියානි ආගමික පුදපූජා සඳහා එය යොදාගැනීම ද සිදුවිය.

මෙකල එය නැරඹීමට එහි ඇදී එන ලක්ෂ සංඛ්‍යාත සංචාරකයෝ එම ගෘහනිර්මාණයේ විශිෂ්ටත්වය දැක පුදුමයට පත්වෙති. පාස්කු උත්සව කාලයේ මහසිකුරාදා දින පාප්වහන්සේ කොලෝසියම් ප්‍රේක්ෂාගාරය තුළට පෙරහැරකින් ගමන් කරති. මෙම ගෘහ නිර්මාණය දිගින් දිගටම ජනප්‍රියව පැවතීම නිසා ඊට තවදුරටත් හානි සිදුවීමෙන් වළක්වාගෙන මතු පරපුර උදෙසා ආරක්ෂා කර ගැනීම පුරාවිද්‍යාඥයින්ට විශාල අභියෝගයක් වී ඇත.



WWW.XTREMEPAPERS.NET

Now answer the following questions in **Sinhala** using your own words as far as possible:

1 කොලෝසියම යනු කුමක් ද? එය පිහිටා තිබෙන්නේ කොහි ද? [2]

2 ග්ලැඩියේටරයින්ට සටන් කිරීමට සිදු වූ ප්‍රතිවාදීන් වර්ග දෙකක් නම් කරන්න. [2]

3 රෝම යුගයේදී විනෝදය සඳහා සතුන් විශාල සංඛ්‍යාවක් යොදාගන්නා ලද බවට ලේඛකයා ඉදිරිපත් කරන සාක්ෂි කවරේද? [2]

4 රෝම යුගයේ දී කොලෝසියම යොදාගනු ලැබූ ක්‍රීඩා නොවන වෙනත් කටයුතු 2 ක් නම් කරන්න. [2]

5 ග්ලැඩියේටරයින් ලෙස වහලුන් යොදාගනු ලැබුවේ මන්ද? [1]

6 ප්‍රේක්ෂකයින් සඳහා කොලෝසියම ආරක්ෂා සහිත බව සහතික කිරීමට ගෘහනිර්මාණ ශිල්පීන් ගෙන තිබූ පියවර කවරේ ද? [2]

7 මධ්‍යතන යුගයේ දි කොලෝසියම යොදාගන්නා ලද්දේ කුමන කටයුතුවලට ද? 2 ක් නම් කරන්න. [2]

8 කොලෝසියම ආරක්ෂා කර ගන්නට ඉතිහාසඥයින්ට අවශ්‍ය මන්ද? [3]

9 රෝම, මධ්‍යතන හා නූතන යන යුග තුනේදීම කොලෝසියම යොදාගනු ලැබූ එක් අරමුණක් සඳහන් කරන්න. [1]

10 රෝම යුගයේ දී කොලෝසියම යොදාගනු ලැබූ ආකාරය පිළිබඳ ඔබේ මතය කුමක් ද? ඔබේ මතයට පක්ෂව හේතු 2 ක් සඳහන් කරන්න. [3]

**Language and spelling [5]**

**Total marks [25]**



WWW.XTREMEPAPERS.NET

**BLANK PAGE**



WWW.XTREMEPAPERS.NET

**BLANK PAGE**



WWW.XTREMEPAPERS.NET

BLANK PAGE

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.

© UCLES 2010



www.XtremePapers.net